සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (I)

## (01) සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු

(පැ එකයි මිනිත්තු තිහයි)

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

---

**1.** (i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් පවත්නා විධිවිධාන කාර්ය පටිපාටික රීති ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ii) (අ) 'සේවා ව්‍යවස්ථාවක්' සහ 'බඳවා ගැනීමේ පටිපාටියක්' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි වෙන වෙන ම කෙටියෙන් විස්තර කරන්න.

(ආ) සේවා ව්‍යවස්ථාවක හෝ බඳවා ගැනීමේ පටිපාටියක අනිවාර්යෙන් ම ඇතුළත් විය යුතු කරුණු සඳහන් කරන්න.

**2.** (i) රාජ්‍ය සේවයෙන් පරිබාහිර සේවාවකට තාවකාලිකව මුදාහැර ඇති රජයේ නිලධාරියෙකුගේ එම මුදාහැරීම අවසන් විය හැකි අවස්ථා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතීන් හි සඳහන් ආකාරය පෙන්වා දෙන්න.

(ii) පහත සඳහන් එක් එක් අවස්ථාවන්හි දී පත්කිරීම් බලධාරීන් විසින් අවධානය යොමු කළ යුතු කරුණු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතී අනුව කෙටියෙන් විස්තර කරන්න.

(අ) අනියම් පදනම මත පත් කිරීම

(ආ) ආදේශක පදනම මත පත් කිරීම

(ඇ) කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම

**3.** ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව පහත සඳහන් කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) මාරු කිරීම් පිළිබඳ කල්දීම

(ii) අතිකාල වැඩ පාලනය

(iii) දුම්රිය බලපත්‍රයක් නිකුත් කළ හැකි කටයුතු

(iv) ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග

**4.** (i) රජයේ නිලධාරියෙකුට ණය/අත්තිකාරම් දියහැකි කාර්යයන් කවරේදැයි සඳහන් කරන්න.

(ii) ගමන් වියදම් දැරීම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් වන විධිවිධාන ආයතන සංග්‍රහය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

**5.** (i) රජයේ නිලධාරියෙකුට වැටුප් වර්ධක වාසි ලබා නොදිය යුතු අවස්ථා කවරේදැයි සඳහන් කරන්න.

(ii) රජයේ නිලධාරියෙකුට වැටුප් වර්ධකයක් ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකි ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.

**6.** (i) ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 13 වන වගන්තියේ විධිවිධාන අනුව රජයේ නිලධාරියෙකුට රාජකාරි නිවාඩු ලබා ගත හැකි අවස්ථා කවරේදැයි සඳහන් කරන්න.

(ii) රජයේ නිලධාරියෙකුගේ නිත්‍ය රැකියාවට හෝ ධුරයට පරිබාහිරව සේවාවක් ඉටු කිරීම සම්බන්ධයෙන් වන විධිවිධාන ආයතන සංග්‍රහය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ
කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (I)

## (02) මුදල් රෙගුලාසි

පැ එකයි මිනිත්තු තිහයි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

1. (i) 'ඒකාබද්ධ අරමුදල' යන්න පැහැදිලි කර, ඒකාබද්ධ අරමුදලින් මුදල් ඉවත්කර ගන්නා අවස්ථා විස්තර කරන්න.
   (ii) රජයේ වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී රජයේ වියදම් වර්ග දෙකක් යටතේ හඳුනා ගනු ලැබේ. එම අදාළ වියදම් වර්ග දෙක නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iii) මුදල් අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කරනු ලබන වොරන්ට් බලපත්‍ර පහක් නම් කරන්න.

2. (i) ජාතික අයවැය ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීමේ ක්‍රියාවලිය පිළිවෙළින් විස්තර කරන්න.
   (ii) අත්තිකාරම් ගිණුම්වර්ග නම් කර, ඒ එක් එක් ගිණුම් වර්ගය සඳහා වසරක් අවසානයේ දී පිළියෙල කළ යුතු ගිණුම් වාර්තා මොනවා දැයි දක්වන්න.

3. (i) මුදල් රෙගුලාසි 102(1) ප්‍රකාරව නැතිවීම/හානි යන්නට ඇතුළත් දෑ මොනවා දැයි පැහැදිලි කරන්න.
   (ii) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි ලේඛනයක තිබිය යුතු කරුණු මොනවා දැයි පැහැදිලි කරන්න.
   (iii) අවිනිශ්චිත අවස්ථා අරමුදලින් අත්තිකාරමක් ඉල්ලුම් කිරීමට යෝග්‍යවන අවස්ථා මොනවා දැයි පැහැදිලි කරන්න.

4. (i) රජයේ දෙපාර්තමේන්තුවක් විසින් පහත සඳහන් සේවාවන් සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට යාමේ දී වවුචර් සහතික කරන නිලධාරියකු විසින් ලබා ගත යුතු විශේෂ සහතික මොනවා දැයි පැහැදිලි කරන්න.
      (අ) රඳවාගැනීම් මුදල් නිදහස් කිරීමේ දී
      (ආ) භාණ්ඩ සැපයීම් සඳහා ගෙවීම් කිරීමේ දී
      (ඉ) වැටුප් වර්ධක ගෙවීමේ දී
      (ඊ) රජයේ නිලධාරියකු විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය සඳහා වන ඉල්ලීමක දී
      (උ) ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් යටතේ ඉටුකරන ලද වැඩ සඳහා ගෙවීම් කිරීමේ දී
   (ii) නිලධාරියකුට හිමි වැටුපෙන් හෝ වේතනයෙන් කළ හැකි අඩු කිරීම් 40% සීමාව නොඉක්මවිය යුතු ය. එම සීමාව ගණනය කිරීමේ දී අදාළ කර නොගන්නා ව්‍යවස්ථාපිත අඩු කිරීම් පහක් නම් කරන්න.

5. (i) වීරමොං ක්‍රියා පටිපාටිය යන්න පැහැදිලි කර, එම ක්‍රියා පටිපාටිය උචිත නොවන අවස්ථා සඳහන් කරන්න.
   (ii) රජයේ ආදායමින් ආපසු ගෙවීමක් සඳහා අයදුම් පත්‍රයක් යොමුකරන දෙපාර්තමේන්තුවක් විසින් සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?
   (iii) දෙපාර්තමේන්තු ප්‍රධානියකු විසින් කිසියම් මාසයක් අවසානයේ ගෙවීම් කරන ලද වවුචර්පත් සම්බන්ධයෙන් මාසය අවසන් වූ පසු ගත යුතු පියවර විස්තර කරන්න.

6. පහත දැක්වෙන දෑ පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) අතුරු සම්මත ගිණුම
   (ii) විශේෂ නීති සේවා
   (iii) මුළු පිරිවැය ඇස්තමේන්තුව
   (iv) අග්‍රිම අධිකාරී බලය
   (v) නියමිත තැනැත්තාට මුදල් ගෙවීම

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ
කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2019 (I)

**(03) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය**

පැය දෙකයි

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වූ විෂය මාලාව විෂය හතකින් සමන්විත වේ. එම විෂය හත නම් කරන්න.

(ii) 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාවෙන් යෝජිත සාමාන්‍ය අධ්‍යාපනයේ දී කනිෂ්ඨ ද්විතීයික පාඨමාලාව හය වන ශ්‍රේණියේ සිට අට වන ශ්‍රේණිය දක්වා වූ අතර විෂයමාලාව විෂය නවයකින් සමන්විත විය. පහත දැක්වෙන එම විෂයයන්ට අමතරව හැදෑරිය යුතු අනෙක් විෂය හතර නම් කරන්න.

(අ) ප්‍රථම භාෂාව
(ආ) ආගම
(ඉ) ගණිතය
(ඊ) ඉංග්‍රීසි
(උ) විද්‍යාව

(iii) 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු වාර්තාව අනුව පාසල් ව්‍යුහය හා එක් ව්‍යුහයක අඩංගු වසර ගණන සඳහන් කරන්න.

(iv) 1998 වර්ෂයේ සිදු වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ උසස් පෙළ සිසුන් ව්‍යාපෘති වැඩවල යෙදීම අනිවාර්ය විය. තම අධ්‍යාපන වසර දෙක තුළ දී ඔවුන් අවසන් කළ යුතුවූ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණ ද? එම ව්‍යාපෘති වර්ග මොනවා ද?

(v) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් සංස්ථාපනය කරන 'සභාවෙහි' සභාපතිවරයාගේ නිල නාමය කුමක් ද?

(vi) 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේ රජයේ දෙපාර්තමේන්තු විසින් පවත්වනු ලබන විභාග සංවිධානය කිරීමේ හා පැවැත්වීමේ බලධාරියා කවු ද?

(vii) 1986 අංක 30 දරන ගුරු අධ්‍යාපන විද්‍යා පීඨ පනත යටතේ විද්‍යා පීඨවල ප්‍රධාන පරිපාලන නිලධාරියා හා විද්‍යායතනවල අධිකාරිවරයා වන තැනැත්තාගේ තනතුරු නාමය සඳහන් කරන්න.

(viii) 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන නීතිය සංශෝධනය විය යුතු බව අවධාරණය කරයි. එම වාර්තාව අනුව පාසල් අධ්‍යාපන පද්ධතියේ ප්‍රධාන නීතිමය පදනම වන්නේ නිදහසට පෙර සම්මත කළ ආඥා පනතකි. එම ආඥා පනත නම් කරන්න.

(ix) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීමට හෝ කටයුතු කිරීමට හෝ නුසුදුසු විය යුතු තැනැත්තන් දෙදෙනෙකු නම් කරන්න.

(x) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරි පනත අනුව එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරියාගේ තනතුරු නාමය දක්වන්න.

*(ලකුණු 4×10=40 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

**2.** (i) 1997 ජනවාරි මස හඳුන්වා දුන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ද්විතීයික අධ්‍යාපනයට අයත් ශ්‍රේණි නම් කරන්න.

(ii) එම ප්‍රතිසංස්කරණ යටතේ පහත සඳහන් ශ්‍රේණිවලට හඳුන්වා දුන් නව විෂයයන් නම් කරන්න.

(අ) 6 ශ්‍රේණිය

(ආ) 6–9 ශ්‍රේණි

(ඉ) 6–11 ශ්‍රේණි

(ඊ) 7–11 ශ්‍රේණි

(iii) එම වැඩපිළිවෙල යටතේ සිසුන්ට ප්‍රවීණතා සහතිකයක් නිකුත් කිරීමට යෝජනා විය. එම ප්‍රවීණතා සහතිකය නිකුත් කරන්නේ කවර ශ්‍රේණි පදනම් කර ගෙන ද?

(iv) එම වැඩපිළිවෙල යටතේ ක්‍රියාකාරකම් කාමර වැඩසටහන හඳුන්වා දෙන ලදී. ක්‍රියාකාරකම් කාමර සඳහා යෝජිත පුළුල් ක්ෂේත්‍ර හතරක් නම් කරන්න.

*(ලකුණු 20 යි)*

**3.** (i) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් ආයතනයේ පරිපාලනය, කළමනාකරණය සහ පාලන කටයුතු පවරා ඇත්තේ කාට ද?

(ii) එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරියාගේ තනතුරු නාමය සඳහන් කරන්න.

(iii) එම ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සතු බලතල දෙකක් හා එය මගින් ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් දෙකක් නම් කරන්න.

(iv) එම ආයතනය ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ආයෝජනය සිදු කරන්නේ කවු ද?

*(ලකුණු 20 යි)*

**4.** (i) පාසල් කළමනාකරණ ක්‍රියාවලියේ දී පාසල් සැලසුම්කරණය අත්‍යවශ්‍ය වේ. පාසල් සැලසුම්කරණයේ දී සැලැස්ම, වැඩසටහන හා ව්‍යාපෘති අතර මූලික වෙනස්කම් මොනවා දැයි උදාහරණ සහිතව විස්තර කරන්න.

(ii) පාසල් සැලසුම්කරණ ක්‍රියාවලියේ දී 'සුවිශේෂී අරමුණු' හා 'ඇගයීම' යන යෙදුම් සැකෙවින් නිර්වචනය කරන්න.

*(ලකුණු 20 යි)*

**5.** (i) 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙහි නීති හා ප්‍රඥප්ති පැනවිය හැකි බලතල ලැයිස්තු තුනකට වෙන්කර දක්වන ලදී. එම ලැයිස්තු තුන නම් කරන්න.

(ii) එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයෙහි මූලික අයිතිවාසිකම් නීතිය යටතේ පාසලක ශිෂ්‍යයන්ට ශාරීරික දඬුවම් පැනවීමේ දී විශේෂයෙන් අවධානය යොමු කළ යුතු වගන්තියක් ඇත. එම වගන්තියේ අංකය හා එම වගන්තියේ නම දක්වන්න.

(iii) මූලික අයිතිවාසිකම් යනු අසීමිත නීති සමූහයක් නොවේ. මූලික අයිතිවාසිකම් නීතියට පනවා ඇති සීමා දෙකක් දක්වන්න.

(iv) නූගත්කම සහමුලින්ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවකම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්ථා ලබා ගැනීමේ අයිතිය සහතික කර ඇත්තේ එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමන පරිච්ඡේදයෙන් ද?

*(ලකුණු 20 යි)*

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

Efficiency Bar Examination for the Officers in Grade III of the
Sri Lanka Teacher Educators' Service – 2019 (I)


**(04) English Language**

*Two hours*

## Instructions to candidates

**Very Important**

Do not use Pencils
to write answers.



Write your Index Number here and on page 3 in the space indicated.

....................................

Checked as correct

....................................

Invigilator's Initials

**Important :**

* *This paper consists of 53 questions on 08 pages.*
* *Answer **all questions on this paper** itself.*
* *Commence answering only after the Centre Supervisor's announcement.*
* ***Instructions given should be strictly followed in answering this paper and marks will not be awarded for answers not in accordance with these instructions.***
* *Even if you are not attempting the paper hand it over to the Supervisor.*
* *Write the answers clearly and legibly in **blue** or **black** ink only and not in pencil.*
* *It is an offence to remove this paper from the examination hall or turn out photocopies of the same.*
* ***Answer scripts with illegible figures, illegible handwriting, those where erasing fluid has been used and written in pencil will not be marked / evaluated.***

**For Examiner's use only**

| Test | Marks awarded |
|---|---|
| 1 – 5 | |
| 6 – 10 | |
| 11 – 15 | |
| 16 – 20 | |
| 21 – 25 | |
| 26 – 30 | |
| 31 - 35 | |
| 36 – 40 | |
| 41 - 50 | |
| 51 | |
| 52 | |
| 53 | |
| **Total** | |

**Final Score**

| | |
|---|---|
| In figures | |
| In words | |

| | |
|---|---|
| Answer Script Marked By | |
| Checked by | |
| | |
| Chief Examiner | |

[*See page two.*

- In the questions from No. **1** to **5**, write correctly the plural form of each noun **on the dotted line** provided.

**1.** Syllabus ..................................

**2.** Ox ..................................

**3.** Analysis ..................................

**4.** Criterion ..................................

**5.** Sheep ..................................

*(01 × 5 = 05 marks)*

- In each of the questions from No. **6** to **10**, **underline** the appropriate part of speech to the word in **bold type** in each sentence.

**6.** He was very cool and **calm** about the mishap.
(1) preposition (2) adverb (3) adjective

**7.** The travellers could **hardly** stand up because the wind was so strong.
(1) conjunction (2) adverb (3) noun

**8.** He spoke tiredly of his **ordeal**.
(1) determiner (2) noun (3) preposition

**9.** All the refugees told stories **of** suffering.
(1) verb (2) preposition (3) pronoun

**10.** I asked the teacher if I could be excused from football practice **as** my knee still hurts.
(1) conjunction (2) preposition (3) adverb

*(01 × 05 = 05 marks)*

- In the questions from No. **11** to **15**, **underline** the correct form of the verb given below to complete each sentence.

**11.** The government has refused to ................. foreign journalists into the war zone for several weeks.
(1) allowed (2) allow (3) will allow

**12.** Would you mind ................. in a questionnaire about what you watch on television?
(1) fill (2) filling (3) to fill

**13.** Please ................. your baggage to prevent confusion.
(1) label (2) labeling (3) labeled

**14.** The film was ................. in several cinemas last year.
(1) showing (2) showed (3) shown

**15.** The supervisor remarked that the new employees ................. very well.
(1) are working (2) will be working (3) were working

*(01 × 5 = 05 marks)*

[See page three.

- In the questions from No. **16** to **20**, **underline the most appropriate word** from the words given to complete each sentence.

**16.** The ministers say that the Government is trying to do more to ................. the public about the consequences of drug abuse.
(1) promote (2) prevent (3) educate

**17.** It is a disgrace that the government ................. so much on projects and so little on education.
(1) neglects (2) spends (3) depends

**18.** Certain children have ................. educational needs and require one-to one attention.
(1) easy (2) poor (3) special

**19.** People's voting habits are ................. political, social, and economic factors.
(1) done through (2) involved in (3) influenced by

**20.** An immediate effect of a war is a breakdown of law and ................. .
(1) harmony (2) justice (3) order

*(01 × 5 = 05 marks)*

- In the questions from No. **21** to **25**, fill in the blanks with the correct form of the verb.

**21.** He inquired politely why the library ................. (be) closed very early.

**22.** She has been ................. (qualify) as a teacher educator for 10 years.

**23.** I ................. (find) some old photos while I was clearing out my cupboards.

**24.** Students are not ................. (allow) to handle chemicals unless they are under the supervision of a teacher.

**25.** We need the repairs ................. (do) as soon as possible.

*(02 × 5 = 10 marks)*

- In the questions from No. **26** to **30**, **underline** the most appropriate **preposition** from the prepositions given within brackets to fill the blanks in the following paragraph.

Charles Dickens was one **26.** ................. (from / of / in ) the greatest nineteenth-century English novelists. At the time of his death in 1870 he was a wealthy man, in contrast to the poverty of his early days. His father owed such a large amount of money that he was sent to prison **27.** ................. (within / in/ for ) three months. At the age of twelve, Dickens was taken away **28.** ................. (from / to / a) school by his parents and made to work in a factory **29.** ................. (from/in/to) London. Charles was not only extremely unhappy, but also ashamed of working there, and he never forgot that period of his life. Years later, **30.** ................. (through/ about/ in) his novel 'Oliver Twist', Dickens described his own childhood experiences.

*(01 × 5 = 05 marks)*

[*See page four.*

- In the questions from No. **31** to **35**, choose the correct relative pronoun or relative adverb given within the brackets to fill in the blanks.

**31.** The city police arrested the robber .................. (which/ who/ whom) burgled the merchant's house yesterday.

**32.** The woman .................. (who/ whose/ why) handbag was lost in the supermarket complained about it to the manager.

**33.** The reason .................. (when/ whom/ why) she resigned that prestigious post is not obvious.

**34.** He is an excellent leader .................. (who/ whom/ whose) every follower likes.

**35.** A factory is a building or set of buildings .................. (which/ how/ where) large amounts of goods are made using machines.

*(01 × 5 = 05 marks)*

- Fill in the blanks question from No. **36** to **40** in the following Role play with the utterances given below.

**You are welcome.**
**The hours and limitations are printed on the card and this handout.**
**You seem to have filled the form out all right.**
**May I have your NIC, please?**
**Sure, let me give you an application.**

**A** : Excuse me. I am interested in getting a library card.

**B** : **36.** ............................................................ . You can fill it out right here at the counter.

**A** : OK, here it is.

**B** : Let me take a look at this for you. **37.** ............................................................

**A** : Here's my NIC and form.

**B** : **38.** ............................................................ . Are you familiar with our rules and fines?

**A** : Yes, I know what to do.

**B** : **39.** ............................................................................................ .

**A** : OK, I see. Thank you.

**B** : **40.** .............................. Thank you for joining the library; we look forward to serving you.

*(02 × 5 = 10 marks)*

[See page five.

- In the questions from No. **41** to **50**, select the appropriate utterances from the list given below and write its **number on the dotted lines** given against each question.

(i) OK. Let's have a cool drink.
(ii) Shall we organize a welcome party?
(iii) I don't know whether to speak to the Secretary or the Chairman. What do you think I should do?
(iv) I'm really sorry about the mix-up. It is my fault.
(v) I'd like you to meet Mr, Aruna Rathnayaka, the new teacher educator.
(vi) May I know whether I can obtain visa for Canada at least by next week?
(vii) Hello, my name's Bandara. I'll be in the same class as you this year.
(viii) I think that the Government should spend more on education.
(ix) Please be informed that all the lectures for this week have been cancelled.
(x) You'd better write a letter and explain the situation.

**41.** Making a suggestion - ..........................................................

**42.** Replying to a suggestion - ..................................................

**43.** Asking for advice - .............................................................

**44.** Giving advice - ....................................................................

**45.** Giving your opinion - ..........................................................

**46.** Giving your information - ...................................................

**47.** Request for information - ...................................................

**48.** Introducing yourself - ........................................................

**49.** Introducing a person - ........................................................

**50.** Apologizing - .......................................................................

*(01 × 10 = 10 marks)*

**For rough work of any question**

[*See page six.*

51. Imagine that you are the President of the Teacher Educators' Union in your District. The Union intends to implement a programme for the development of teacher educators' skills in their career.

Write a **Report** to be submitted to the Minister of Education for approval of the programme. Use about **100** words.

- Purpose, schedule and duration of the programme
- Number of participants, expenses for facilitations
- Other important details

*(10 marks)*

**For rough work of any question**

[*See page seven.*

52. Approval for a programme for the development of teacher educators' skills in their career has been granted by the Minister of Education. Being the Secretary of the Teacher Educators' Union you are to make all its members aware of the programme.

Write a **NOTICE** with relevant information to convene a meeting of the members of the Teacher Educators' Union.

*(10 marks)*

53. Write a **short article** on **one** of the following topics. Use **about 125** words.

(i) Sri Lankan Education needs a system change

(ii) Significance of a National Education Policy in Sri Lanka

(iii) Role of Media and Its Contribution to the Development of Sri Lanka.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

[See page eight.

(20 marks)

**For rough work of any question**

* * *